# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1894/28 - 2014 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2014.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

2014 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් සම්මත කොට 2014 දෙසැම්බර් මස 05 වැනි දින උතුරු මැද පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

ආර්. කේ. ප්‍රේමසිරි,
ලේකම්,
උතුරු මැද පළාත් සභාව.

2014 දෙසැම්බර් මස 18 වැනි දින,
උතුරු මැද පළාත් සභාවේ දී ය.

**2014 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය**

2014 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය 2014 නොවැම්බර් මස 10 වන දින පැවැත්වූ උතුරු මැද පළාතේ පළාත් සභා රැස්වීමේදී සම්මත වූ බව මෙයින් සහතික කරමි.

ටී. එම්. ආර්. සිරිපාල,
සභාපති,
උතුරු මැද පළාත් සභාව.

2014 නොවැම්බර් මස 27 වැනි දින

වර්ෂ 2014 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින මා විසින් සහතිකය සටහන් කරන ලදී.

කරුණාරත්න දිවුල්ගනේ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

*2014 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය*

2015 මුදල් වර්ෂයේ වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, ඒ මුදල් වර්ෂය තුළ උතුරු මැද පළාත් සභාවේ කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් එම මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, පළාත් අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම හා යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහායි.

*2014 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය*
(සහතිකය සටහන් කළේ 2014.12.05 වැනි දිනය)

2015 මුදල් වර්ෂයේ වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, ඒ මුදල් වර්ෂය තුළ උතුරු මැද පළාත් සභාවේ කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් එම මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, පළාත් අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම හා යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ ප්‍රඥප්තියකි.

ලුහුඬු නාමය

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ. මෙම ප්‍රඥප්තිය උතුරු මැද පළාත් සභාවේ 2014 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2015 මුදල් වර්ෂය සඳහා විසර්ජනය

02. (I) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන් කිසි නීතියකට හානියක් නොමැතිව මේ ප්‍රඥප්තියෙහි 2015 මුදල් වර්ෂය යනුවෙන් සඳහන් කරනු ලබන, 2015 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භවී 2015 දෙසැම්බර් මස 31 ක් වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් එක් දහස් හත්සිය දාහතර කෝටි හාර ලක්ෂ පනස් දාහක් වූ පළාත් සභාවේ වියදම පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ යෙදීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින් පියවිය යුතුය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් එක් දහස් හත්සිය දාහතර කෝටි හාර ලක්ෂ පනස් දාහක් වූ මුදලින් රුපියල් එක්දහස් හයසිය විසිපන් කෝටි පනස් පන් ලක්ෂ පනස් දහසක මුදල මේ ප්‍රඥප්තියේ පළමුවන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(II) මේ වගන්තියේ (I) උප වගන්තියේ විධිවිධාන පළාත් සභාව සඳහා හා පළාත් සභාව වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට, විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතුය.

වැඩසටහනක පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලද නමුත් වියදම් නොකරන ලද වියදමේ මුදල් ඒ වැඩසටහනේම වෙනත් මුදල් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේම වූ වෙනත් වැඩ සටහනකට හෝ මාරු කිරීමේ බලය

03. (I) මේ ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර වෙන් කරනු ලැබූවා වූද, එසේ වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු වියහැකි වූද, යම් මුදලක් එම වැඩසටහනේම මූලධන වියදම් වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙන යම් වැඩසටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ ප්‍රධාන ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධාරියකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකිය.

(II) මේ ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ මූලධන වියදමකට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතුය.

2015 මුදල් වර්ෂය සඳහා ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදනය

04. මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ සඳහන් උතුරු මැද පළාතේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ඇස්තමේන්තු කර ඇති උපරිම වියදම් සීමාව වන රුපියල් අසූ අට කෝටි හතලිස් නව ලක්ෂය උතුරු මැද පළාත් සභා අරමුදලින් දැරීමටත්, අත්තිකාරම් ගිණුම් කටයුතු වෙනුවෙන් ලැබේ යැයි ඇස්තමේන්තු කර ඇති රුපියල් තිස් අට කෝටි හතලිස් හය ලක්ෂ අනූපන් දහස උතුරු මැද පළාත් සභා අරමුදලට ලබා ගැනීමටත් මෙයින් බලය දෙනු ලැබේ.

(I) මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ (iii) වන තීරයෙහි දැක්වෙන එක් එක් ගිණුම් කාර්යයෙන් පළාත් සභාව ලබන ලැබීම් ඒ කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල එකතුව එම උපලේඛනයේ (v) වන තීරයේ අනුරූපී සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම් එය 2015 මුදල් වර්ෂය අවසන් වී තුන් මාසයක් ඉකුත්වීමට පෙර පළාත් සභා අරමුදලට ගෙවිය යුතුය.

(II) (I) වන උප වගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම් එනම් ;

(අ) යම් කටයුත්තක ආදායම අයකිරීම සඳහා නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත හෝ එම කටයුත්තේ කාර්ය සාධන සංස්ථාපන හා වෙනත් වියදම්

සහ

(ආ) යම් කටයුත්තක වංචල හා නිශ්චල දේපල ක්ෂය වීම ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩු කළ යුතුය.

(III) මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ (iii) වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන් 2015 මුදල් වර්ෂය තුළ පළාත් සභාව විසින් දරනු ලබන වියදම් ඒ මුදල් වර්ෂය තුළදී ඒ කටයුත්තෙන් පළාත් සභාව ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ (iv) වන තීරයෙහි අනුරූපී සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය ඒ උපලේඛනයේ (vi) වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(iv) මෙම වගන්තියේ සඳහන් අත්තිකාරම් ගිණුම්වල උපරිම වියදම් සීමාව (හර) සහ අවම ලැබීම් සීමාව (බැර) තීරණය කිරීමේදී මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ සඳහන් අත්තිකාරම් ගිණුම් අතර මුදල් හුවමාරුවකින් තොරව ණය ශේෂ පියවීම සඳහා කරනු ලබන හර සහ බැර සැලකිල්ලට නොගත යුතුය.

*2015 මුදල් වර්ෂය තුළදී 4 වන වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් යම් අරමුදලකින් නැතහොත් මුදල් වලින් අත්තිකාරම් ගෙවීම*

05. 2015 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ (iii) තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් පළාත් සභාව ලබන ලැබීම් ඒ කටයුත්ත සම්බන්ධයෙන් පළාත් සභාව විසින් දරනු ලබන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඒ වියදම් පියවීම සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා සලකන මුදල්, පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ඔහු විසින් නියමයක් මගින් කලින් කළ විධාන කරනු ලැබිය හැකිය. එසේ වුවද එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල එකතුව ඒ උපලේඛනයේ (iv) වන තීරයේ අනුරූපී සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. ඒ කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතුය.

06. (I) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම් බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩුවිය හැකි බවට හෝ,

*කලින් බලය දෙනු ලැබූ වියදම් සීමා කිරීමට අමාත්‍යවරයා සතු බලය*

(II) යම් විශේෂ කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට, අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක පළාත් සභා අරමුදලින් හෝ පළාත් සභාවේ හෝ පළාත් සභාවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීමට අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ අනුමැතිය ඇතිව කරනු ලැබිය හැකිය.

මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

07. (i) මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ (iv) තීරයෙහි සහ (vi) වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්,

(11) මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ (v) වන තීරයෙහි දැක්වෙන අවම සීමා,

අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ අනුමැතිය ඇතිව නියමයක් මගින් 2016 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම් හෝ අමුතු කිරීම් හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක් යෝජනා සම්මතයක් මගින් පළාත් සභාව විසින් අනුමත කර ඇත්නම් මිස බල නොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයකද ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යැයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වන ලෙස සැලකිය යුතුය.

මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීමට පළාත් සභාව සතු බලය.

08. පළාත් සභාව විසින් යෝජනා සම්මතයක් මගින් මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ

(I) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්,

(II) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

අමාත්‍යවරයා යන්න අර්ථ දැක්වීම.

09. මෙහි අමාත්‍යවරයා යන්න එම අවස්ථාවේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අමාත්‍යවරයා අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

10. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**පළමුවන උපලේඛනය**

***පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු වියදම්***

| *ශීර්ෂ අංකය* | *ආයතනය* | *පුනරාවර්තන වියදම් රු.* | *මූලධන වියදම් රු.* |
|---|---|---|---|
| 600 | ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය<br>වැඩසටහන - 3<br>පළාත් සභා පරිපාලනය | 28,693,000 | 17,000,000 |
| 601 | පළාත් සභාව සහ සභා ලේකම් කාර්යාලය<br>වැඩසටහන - 3<br>පළාත් සභා පරිපාලනය | 90,963,000 | 3,600,000 |
| 602 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br>වැඩසටහන - 3<br>පළාත් සභා පරිපාලනය | 12,652,000 | 1,900,000 |
| 603 | සමුපකාර සේවක කොමිෂන් සභාව<br>වැඩසටහන - 3<br>පළාත් සභා පරිපාලනය | 3,969,000 | 1,000,000 |

පළමුවන උපලේඛනය (සම්බන්ධිතයි)

*පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු වියදම්*

| *ශීර්ෂ අංකය* | *ආයතනය* | *පුනරාවර්තන වියදම රු.* | *මූලධන වියදම රු.* |
|---|---|---|---|
| | *ප්‍රධාන අමාත්‍ය, උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය* | | |
| 610 | ප්‍රධාන අමාත්‍ය, උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන - 3<br>පළාත් සභා පරිපාලනය | 149,355,000 | 17,800,000 |
| | වැඩ සටහන - 52<br>ප්‍රාදේශීය සංවර්ධනය | 164,225,000 | 816,200,000 |
| 611 | පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන - 3<br>පළාත් සභා පරිපාලනය | 591,060,000 | 192,000,000 |
| 612 | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන - 40<br>ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 41,094,000 | 7,000,000 |
| 613 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන - 43<br>වාරිමාර්ග | 120,874,000 | 138,000,000 |
| 614 | පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන - 90<br>ක්‍රීඩා | 44,397,000 | 34,000,000 |
| | පළාත් කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන, සත්ව සෞඛ්‍ය, ධීවර, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය | | |
| 620 | පළාත් කෘෂිකර්ම හා සත්ව නිෂ්පාදන, සත්ව සෞඛ්‍ය, ධීවර, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන - 3<br>පළාත් සභා පරිපාලනය | 42,819,000 | 3,000,000 |
| | වැඩ සටහන - 44<br>කෘෂිකාර්මික සංවර්ධන හා ව්‍යාපෘතිය | - | 73,500,000 |
| | වැඩ සටහන - 45<br>පශු සම්පත් සංවර්ධනය | | |
| | වැඩ සටහන - 51<br>කර්මාන්ත සංවර්ධනය | | |
| 621 | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන - 44<br>කෘෂිකාර්මික සංවර්ධනය | 92,020,000 | 61,000,000 |
| 622 | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>වැඩ සටහන - 45<br>පශු සම්පත් සංවර්ධනය | 102,894,000 | 31,000,000 |

පළමුවන උපලේඛනය (සම්බන්ධිතයි)

*පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු වියදම්*

| *ශීර්ෂ අංකය* | *ආයතනය* | *පුනරාවර්තන වියදම රු.* | *මූලධන වියදම රු.* |
|---|---|---|---|
| | *පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධනය, පරිවාස හා ළමාරක්ෂක, කාන්තා කටයුතු, ප්‍රවාහන හා නිවාස කටයුතු අමාත්‍යාංශය* | | |
| 630 | පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, කාන්තා කටයුතු, ප්‍රවාහන හා නිවාස කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන - 3 | | |
| | පළාත් සභා පරිපාලනය | 71,664,000 | 51,000,000 |
| 631 | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 70 | | |
| | රෝහල් සේවාවන් | 1,817,251,000 | 510,000,000 |
| | වැඩ සටහන - 71 | | |
| | මහජන සෞඛ්‍ය සේවාවන් | 508,163,000 | |
| | වැඩ සටහන් - 72 | | |
| | පොදු සෞඛ්‍ය සේවාවන් | 264,316,000 | |
| | වැඩ සටහන් - 74 | | |
| | පර්යේෂණ හා සංවර්ධන | 1,281,000 | |
| 632 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 73 | | |
| | දේශීය වෛද්‍ය සේවාවන් | 210,905,000 | 46,000,000 |
| 633 | පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 95 | | |
| | සමාජ ආරක්ෂණය | 53,818,000 | 28,000,000 |
| 634 | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 95 | | |
| | සමාජ ආරක්ෂණය | 337,508,000 | 22,000,000 |
| | *පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත පේෂකර්මාන්ත, ග්‍රාම සංවර්ධන, සංචාරක කටයුතු අමාත්‍යාංශය* | | |
| 640 | පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත, පේෂකර්මාන්ත, ග්‍රාම සංවර්ධන, සංචාරක කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන - 3 | | |
| | පළාත් සභා පරිපාලනය | 36,299,000 | 43,000,000 |
| 641 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 53 | | |
| | සමුපකාර සංවර්ධන | 47,135,000 | 12,000,000 |
| 642 | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 51 | | |
| | කර්මාන්ත සංවර්ධන | 71,210,000 | 18,000,000 |
| 643 | පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 60 | | |
| | ප්‍රජා සංවර්ධනය | 25,708,000 | 14,100,000 |

පළමුවන උපලේඛනය (සම්බන්ධිතයි)

*පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු වියදම්*

| ශීර්ෂ අංකය | ආයතනය | පුනරාවර්තන වියදම රු. | මූලධන වියදම රු. |
|---|---|---|---|
| | පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | |
| 650 | පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන - 3 | | |
| | පළාත් සභා පරිපාලනය | 72,926,000 | 12,000,000 |
| 651 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 3 | | |
| | පළාත් සභා පරිපාලනය | 220,919,000 | 89,400,000 |
| | වැඩ සටහන - 80 | | |
| | ප්‍රාථමික අධ්‍යාපනය | 2,209,253,000 | 129,200,000 |
| | වැඩ සටහන - 81 | | |
| | ද්විතීයික අධ්‍යාපනය | 4,391,602,000 | 279,900,000 |
| | වැඩ සටහන - 87 | | |
| | අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම | 36,009,000 | 9,600,000 |
| | වැඩ සටහන - 88 | | |
| | අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා | 62,669,000 | |
| 652 | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 91 | | |
| | සංස්කෘතික සංවර්ධනය | 7,306,000 | 18,500,000 |
| 660 | ප්‍රධාන ලේකම් කාර්යාලය | | |
| | වැඩ සටහන - 3 | | |
| | පළාත් සභා පරිපාලනය | 91,858,000 | 185,900,000 |
| | වැඩ සටහන - 9 | | |
| | මානව සම්පත් සංවර්ධනය | 14,056,000 | 13,100,000 |
| 661 | පළාත් භාණ්ඩාගාරය | | |
| | වැඩ සටහන - 8 | | |
| | මූල්‍ය කළමනාකරණය | 520,600,000 | 574,000,000 |
| 662 | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 3 | | |
| | පළාත් සභා පරිපාලනය | 25,620,000 | 84,500,000 |
| 663 | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 52 | | |
| | ප්‍රාදේශීය සංවර්ධනය | 79,722,000 | 10,500,000 |
| 664 | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 8 | | |
| | මූල්‍ය කළමනාකරණය | 9,791,000 | 400,000 |
| 665 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන - 3 | | |
| | පළාත් සභා පරිපාලනය | 30,146,000 | 4,700,000 |
| | එකතුව | 12,702,750,000 | 3,552,800,000 |

*උතුරු මැද පළාත් සභාව*

*මුදල් ප්‍රකාශය - 2015*

දෙවන උපලේඛනය

*අත්තිකාරම් ගිණුම් කටයුතු*

| *කාර්යාලය* I | *ගිණුම් අංකය* II | *ගිණුම් කාර්යය* III | *හර රු.* IV | *බැර රු.* V | *අවසාන ශේෂය රු.* VI |
|---|---|---|---|---|---|
| පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | 60001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 800,000 | 750,000 | 4,000,000 |
| පළාත් සභා ලේකම් කාර්යාලය | 60101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 1,000,000 | 950,000 | 5,800,000 |
| | 60111 | පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය අත්තිකාරම් | - | 5,000,000 | 15,000,000 |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 60201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 1,200,000 | 1,000,000 | 4,100,000 |
| පළාත් සමුපකාර සේවා කොමිෂන් සභාව | 60301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 500,000 | 400,000 | 1,800,000 |
| ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය, හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | | | | | |
| ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය, හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 61001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 4,500,000 | 3,500,000 | 11,000,000 |
| | 61002 | රජරට එෆ් එම් සේවා අත්තිකාරම් ගිණුම | 3,000,000 | 2,000,000 | 1,050,000 |
| | 61003 | තාර මිලට ගැණුම් අත්තිකාරම් | 25,000,000 | 25,000,000 | 15,000,000 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 61101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 8,000,000 | 6,800,000 | 25,000,000 |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 61201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 3,000,000 | 2,000,000 | 6,000,000 |
| පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 61301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 1,800,000 | 4,000,000 |
| පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 61401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,000,000 | 2,500,000 | 7,000,000 |
| උප එකතුව | | | 51,500,000 | 51,700,000 | 99,750,000 |

*උතුරු මැද පළාත් සභාව*

*මුදල් ප්‍රකාශය - 2015*

**දෙවන උපලේඛනය**

***අත්තිකාරම් ගිණුම් කටයුතු***

| *කාර්යාලය*<br>I | *ගිණුම් අංකය*<br>II | *ගිණුම් කාර්යය*<br>III | *හර රු.*<br>IV | *බැර රු.*<br>V | *අවසාන ශේෂය රු.*<br>VI |
|---|---|---|---|---|---|
| පළාත් කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය | | | | | |
| පළාත් කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර, පරිසර, සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය | 62001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 2,000,000 | 10,000,000 |
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 62101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 9,000,000 | 6,500,000 | 25,000,000 |
| | 62102 | කෘෂි සංවර්ධන අත්තිකාරම් | 1,500,000 | 1,000,000 | 500,000 |
| පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 62201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 10,000,000 | 6,700,000 | 10,374,080 |
| | 62202 | සත්ව සංවර්ධන අත්තිකාරම් | 3,000,000 | 1,500,000 | 1,000,000 |
| | | | | | |
| පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, කාන්තා කටයුතු, ප්‍රවාහන හා නිවාස පිළිබඳ අමාත්‍යාංශය | | | | | |
| පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, කාන්තා කටයුතු, ප්‍රවාහන හා නිවාස පිළිබඳ අමාත්‍යාංශය | 63001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,000,000 | 1,800,000 | 8,000,000 |
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 63101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 80,900,000 | 40,000,000 | 140,000,000 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 63201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 12,000,000 | 6,000,000 | 25,000,000 |
| පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්ත්මේන්තුව | 63301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 2,000,000 | 7,000,000 |
| පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 63401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 6,500,000 | 3,900,000 | 10,000,000 |
| පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය | | | | | |
| පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය | 64001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 2,200,000 | 6,500,000 |
| පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 64101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 4,500,000 | 5,000,000 | 20,000,000 |
| පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 64201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 7,000,000 | 6,500,000 | 12,000,000 |
| | 64202 | පේෂකර්මාන්ත කටයුතු අත්තිකාරම් | 16,000,000 | 12,000,000 | 25,000,000 |
| | 64203 | වඩු පාසැල් කටයුතු අත්තිකාරම් | 17,000,000 | 15,000,000 | 10,000,000 |
| පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 64301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 3,500,00 | 2,500,000 | 12,000,000 |
| උප එකතුව | | | 180,400,000 | 114,600,000 | 322,374,080 |

*උතුරු මැද පළාත් සභාව*

*මුදල් ප්‍රකාශය - 2015*

**දෙවන උපලේඛනය**

***අත්තිකාරම් ගිණුම් කටයුතු***

| කාර්යාලය<br><br>I | ගිණුම් අංකය<br><br>II | ගිණුම් කාර්යය<br><br>III | හර රු.<br><br>IV | බැර රු.<br><br>V | අවසාන ශේෂය රු.<br><br>VI |
|---|---|---|---|---|---|
| පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | | | | |
| | | | | | |
| පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 65001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 2,300,000 | 9,000,000 |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 65101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් අධ්‍යයන කා.ම. | 600,000,000 | 192,310,000 | 1,002,000,000 |
| | 65111 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් අනධ්‍යයන කා.ම. | 25,000,000 | 4,500,000 | 23,000,000 |
| පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 65201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 500,000 | 285,000 | 1,500,000 |
| | | | | | |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 66001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 3,500,000 | 1,200,000 | 95,000,000 |
| ප්‍රාදේශීය පාලනය | 66011 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 500,000 | 50,000 | 1,500,000 |
| පළාත් භාණ්ඩාගාරය | 66101 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 1,500,000 | 7,000,000 |
| පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 66201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2,500,000 | 2,000,000 | 10,000,000 |
| පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 66301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 8,000,000 | 7,000,000 | 25,000,000 |
| | 66302 | තත්ව පාලන අත්තිකාරම් ගිණුම් | 6,000,000 | 5,500,000 | 500,000 |
| පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 66401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 500,000 | 450,000 | 2,000,000 |
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 66501 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 1,500,000 | 1,300,000 | 10,000,000 |
| *උප එකතුව* | | | 653,000,000 | 218,395,000 | 1,186,500,000 |
| | | | | | |
| මුළු එකතුව | | | 884,900,000 | 384,695,000 | 1,608,624,080 |

01 - 351

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.